# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## පිය දසුන පදනම (සංස්ථාගත කිරීමේ)

**පිය දසුන පදනම සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා විසින්
2011 ජුනි මස 22 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2011 මැයි මස 05 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[113 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# පිය දසුන පදනම
# (සංස්ථාගත කිරීමේ)

## පිය දසුන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

“පිය දසුන පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන සංගමයක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ සංගමයේ, පමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2011 අංක  දරන පිය දසුන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පිය දසුන පදනම සංස්ථාගත කිරීම.

2. මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන) පිය දසුන පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව මින් මතු බඳවාගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” වශයෙන් හඳුන්වනු ලබන) “පිය දසුන පදනම” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමේ, එය පාවිච්චි කිරීමේ, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) තරුණ ශ්‍රමය හා තරුණ ජවය කාර්යක්ෂම හා ඵලදායි ලෙස ජාතික අභිවෘද්ධිය සඳහා යොදවා ගැනීමට අවශ්‍ය පහසුකම් සැකසීම හා ඊට දායක වීම ;

(ආ) ශ්‍රී ලංකාවේ විවිධ ජාතීන් අතර සාමය, හොඳහිත, අවබෝධය හා සහයෝගය වර්ධනය කිරීම ;

(ඇ) ආධාර ලැබීමට සුදුසු ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට තම අධ්‍යාපනය කරගෙන යාම සඳහාත්, දරු දැරියන් නොකඩවා පාසල් ඒමට දිරි ගැන්වීම සඳහාත් ආධාර, දීමනා, ත්‍යාග හා ශිෂ්‍යත්ව ලබා දීම සහ ඔවුන්ගේ අධ්‍යාපනික, දාර්ශනික ආගමික, සංස්කෘතික හා විද්‍යාත්මක කටයුතු දියුණු කර ගැනීමට උදව් කිරීම සහ ස්ථිර හා ජංගම පුස්තකාල ඇති කිරීම ;

(ඈ) මිනිස් අයිතිවාසිකම්, මිනිස් සාරධර්ම, මූලික නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය හා බහු ජනාවාසය වර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම ;

(ඉ) ශ්‍රී ලංකාවේ විවිධ ජන කොටස් හා ජාතීන් එකමුතු හා ශක්තිමත් කිරීම සඳහා සමාජ හා සංස්කෘතික ක්‍රියාකාරකම් උනන්දු කරවීම ;

(ඊ) කාන්තාවන්, ළමුන්, අබල දුබල තැනැත්තන්ගේ හා දුප්පතුන්ගේ අභිවෘද්ධිය සැලසීම ;

(උ) මානුෂික, ක්‍රීඩා, සාහිත්‍ය හා අධ්‍යාත්මික ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම හා උනන්දු කරවීම ;

(ඌ) ජාති, ආගම්, කුළ බේදයෙන් තොරව අධ්‍යාපනික, ආගමික, සංස්කෘතික, කලා හා ක්‍රීඩා පහසුකම් දියුණු කිරීම සඳහා ආධාර උපකාර කිරීම සහ විවිධ උත්සව හා තරග පැවැත්වීම ;

(එ) දුප්පත්, අනාථ සහ රෝගී තැනැත්තන්ට වෛද්‍ය සහන, ආහාර සැපයීම, මහලු අය සහ අවතැන් වූ අය වෙනුවෙන් නිවාස පිහිටුවීම හා පවත්වාගෙන යාම, ළමා නිවාස පිහිටුවීම මෙන්ම ළමා හා වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යාම ; සහ

(ඒ) ඉහත දැක්වෙන පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සංවිධාන සමග සහයෝගීව කටයුතු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ පවත්නා රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව තෝරා පත්කරනු ලබන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු නව දෙනකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) පදනමේ ආරම්භක සාමාජිකයා වූ ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ යාවජීව සභාපතිවරයා විය යුතු අතර සභාපති ධූරය දැරූ පුද්ගලයාගේ පවුලේ සාමාජිකයකු අධ්‍යක්ෂ මණ්ඩලයේ ඊළඟ සභාපතිවරයා විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(4) සභාපතිවරයා හැර අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු මියයාම හෝ ඉල්ලා අස්වීම නිසා කලින් ධූරය අත්හළහොත් මිස, අවුරුදු හතරක කාලයක් සඳහා ධූරය දැරිය යුතු ය. මිය යාම හෝ ඉල්ලා අස්වීම නිසා අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, එම පුරප්පාඩුව පිරවීම සඳහා නව සාමාජිකයකු පත් කළ යුතු අතර, එම නව සාමාජිකයා අවුරුදු හතරක් ධූරය දැරිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබාගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කළ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානයන්ට අනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, අස්කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු;

(ආ) සංස්ථාවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එකී රැස්වීම්වල ගණපූර්ණය ද, ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා අවශ්‍ය කරන සුදුසුකම්; සහ

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් කිසි රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් ම සහ එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැක්කේ ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.**

7. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති පදනමේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු සම්මාදම් මුදල් හෝ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ අරමුදල.**

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් භාරගන්නා ලද හෝ මින් මතු භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් වූ මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි සංස්ථාවේ නමින් එක බැංකුවක හෝ බැංකු කීපයක තැන්පත් කළ යුතු ය.

(2) මෙම පනත යටතේ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින්

දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල්, සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, බද්දට ගැනීමක්, තෑගි ලැබීමක්, කිසියම් ගිවිසුමක් මත හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල දේපළක් අත් කර ගැනීමට හා දැරීමට නීතියෙහි ලා සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එම දේපළ සංස්ථාවේ කාර්යය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය. තව ද, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාවට ඇත්තේ ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයන් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසුව කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදිය යුතු අතර, ඒවා සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති සහ ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර, බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම, සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය.

**12.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වැය කරන ලද සංස්ථාවේ සියලු මුදල් පිළිබඳව ගිණුම් නිසි අයුරින් තැබීමට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විගණකවරයකු හෝ විගණකවරයන් විසින් සෑම වර්ෂයකදීම යටත් පිරිසෙයින් එක් වරක් ගිණුම් පරීක්ෂා කොට විගණනය කරගත යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

13. සංස්ථාවේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් සාමාජිකයකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයේ තම නම් ලියා අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

15. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.